# රටවල් හා සංවිධාන 84 ක් සහභාගි වු යුරෝපයේ තවත් විශාල සංදර්ශණයකදී ශ්‍රී ලංකාවට දෙවන ස්ථානය හිමි වේ

.

විවිධ රටවල් හා සංවිධාන වල සහභාගිත්වයෙන් 2014 ජුනි මස 08 වනදින බර්ලින් අගනුවරදි විදි සංචාරය කළ සංස්කෘතික සංදර්ශණයකදි ශ්‍රී ලංකාව නියෝජනය කරමින් එම සංස්කෘතික සංදර්ශණයට සහභාගි වු බර්ලින් පිහිටි ශ්‍රී ලංකා සංගමය දෙවන ස්ථානය හිමිකර ගනිමින් ශ්‍රී ලංකාවට අති විශිෂ්ඨ ජයග්‍රහණයක් අත්පත් කර ගත්තේය.

බර්ලින් ශ්‍රී ලාංකිකයින්ගේ සංගමයට මෙම සම්මානය හිමිවුයේ ඔවුන්ගේ ප්‍රදර්ශණයට සහභාගිවිමේ තේමාවටත්, එම නර්ථන කණ්ඩායමේ රඟ දැක්වීම, මොණරෙකු ලෙස හැඩ ගන්වා තිබු යාත්‍රාවටත්, එහිදි වාදනය කළ සංගීතයටත් සමස්ථ ශ්‍රී ලංකාවේ නියෝජනයටත්ය.

ශ්‍රී ලංකාවේ තේමාව වන 'සංස්කෘතීන් යා කරමු, නටමු, වයමු ජන කොටස් අතර හොඳ විශ්වාසය හා අන්‍යයෝන්‍ය අවබෝධය ගොඩනැගුමට රිද්මයක් එක් කරමු' මෙම සංදර්ශණය නැරඹිමට පැමිණියන්ගේ හද බැඳගන්නට සමත් විය. මොණරකුගේ ස්වරූපයෙන් සරසා තිබු යාත්‍රාවේත්, නර්ථන කණ්ඩායමේ මයුර වන්නමේත් ප්‍රති මුර්තිය වුයේ ශ්‍රී ලංකාවේ වෙසෙන සියලුම ජන කොටස්වල සාමය හා සහජිවනයයි.

මෙම සංස්කෘතික ප්‍රදර්ශණය මාර්ගය දෙපස රැස්ව සිටි 740000 ක පමණ වන ජනකායක්, ජර්මනියේ ප්‍රධානපෙළේ රූපවාහිණී නාලිකා මගින් යුරොපයෙහි වෙසෙන මිලියන් ගනන් ජනතාවත් නැරඹිය. බර්ලින් පිහිටි ශ්‍රී ලංකා තනාපති කාර්‍යාලයේත්, ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්‍යාංශයේත්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයේත් පූර්ණ දායකත්වය මෙම සංස්කාතික සංදර්ශණයට සහභාගි විම සදහා බර්ලින්හි ශ්‍රී ලංකිකයන්ගේ සංගමයට ලැබුණි.

2012 වසරේදි චන්න උපුලි නර්ථන කණ්ඩායමේ දායකත්වයෙන් බර්ලින්හි ශ්‍රී ලංකා සංගමයට රටවල් 99 කින් ප්‍රථම ස්ථානය හිමිකර ගැනීමට හැකි විය. වසරක නිහඬතාවයකින් පසුව ජර්මනියේ පැරනිතම ශ්‍රී ලංකිකයන්ගේ සංගමයක් වන බර්ලින් හි සංගමය තම මාතෘ භූමියේ විවිධ සංස්කෘතික අංග හා උරුමයන් ඉතාමත් ආකර්ශණිය ලෙස දහස් ගනන් ප්‍රේක්ෂකයියන් ඉදිරියේ විදහා දැක්වුයේය.

ප්‍රථම ස්ථාන හිමි වුයේ කොලොම්බියාවේ සංස්කෘතික ප්‍රදර්ශණයටය. අසියානු රටවල් අතරින් මෙම සම්මානය හිමිකර ගැනිමට හැකි වු එකම රට ශ්‍රී ලංකාවයි. මෙම සංදර්ශණයට රටවල් ගනනාවක් ශ්‍රී ලංකා ආයෝජන කලාට වඩා මුදල් ආයෝජනය කරමින් විවිධ රටවල් හා සංවිධාන මෙම සංදර්ශණයේදි තරග වැදී සිටියේය. මෙම සංදර්ශණයේදි ශ්‍රී ලංකාවේ උඩරට, පහත රට නර්තනයන් සිංහල, දෙමල, මුස්ලිම් හා මැලේ බර්ගර් යන විවිධ ජන කොටස් නියොජනය කරමින් උඩරට හා පහත රට නර්ථනයන්ද ඉදිරිපත් කිරිමට

අවසන් නර්ථන අංශය වුයේ අවස්ථාවට උචිත වන පරිදි මයුර වන්නම උඩරට බෙර නදට රග දැක්වීමයි. මයුර වන්නම රග දක්වන ලද්දේ අංජලී දිසානායක විසින් දක්‍ෂ ලෙස පුහුණු කරන ලද නර්ථන කණ්ඩායමක් විසිනි. පැය අටක් පමණ කාලසිමාවක් බර්ලින්හි විදි සංචාරය කරන ලද මෙම සංදර්ශණය පුරාවට ශ්‍රී ලාංකිකයින් තම මව්බිමෙහි ධජ ඉහලට ඔසවා ප්‍රදර්ශණය කරමින් සිටියේය.

ජර්මනියේ වෙසෙන ශ්‍රී ලංකාවේ විවිධ ජන කොටස් වලට අයත් ශ්‍රී ලාංකිකයන් තම සාමුහිකත්වය සහජිවනය ප්‍රතිමුර්තිමත් කරමින් එක්සත්ව මෙම ප්‍රදර්ශණයට සහභාගිවිම කාගේත් පැසසුමට ලක් විය.සිංහල හා ද්‍රවිඩ ගයනා සංදර්ශණය පුරාවට වාදනය කරනු ලැබු අතර මග දෙපස රැස්ව සිටි බොහෝ ශ්‍රී ලාංකික ද්‍රවිඩ ජනයා සංදර්ශණයට එක්වෙමින් සිංහල දෙමල ගීත වලට උද්යෝගීව නර්තනයෙන් සහභාගිවිම කැපි පෙනෙන විශේෂ සිද්ධියක් ලෙස මෙහිදි සතුටින් සදහන් කිරිම අගෙයි. මෙම සංදර්ශණයේ තවත් ආකර්ශණීය අංගයක් වුයේ මව පියා පුතු යන සංයුතිය ප්‍රතිමුර්වත් කරන ශ්‍රී ලංකා තානාපති කාර්යාලය මගින් සපයා දී තිබු තුන්පත් රූනයි  මෙවැනි අංගයක් කිසිම සංවිධානයකින් මෙම සංදර්ශණයට එක්කර නොතිබිණි,

ශ්‍රී ලාංකිකයින්ගේ සංගමයේ ප්‍රථමයෙන් ගමන් කල විශාල මොණරකුගෙන් සමන්විත මයුර යානය මෙහි නිරික්‍ෂණ මණ්ඩලයේ විශේෂ පැසසුමට ලක්විය. ශ්‍රී ලංකාවට මෙහි නිරික්‍ෂණ මණ්ඩලයෙන් ලකුණු 104 ක් ලැබුණු අතර ප්‍රථම ස්ථානය ගත් කොලොම්බියාවට ලකුණු 108 ක්ද තුන්වන ස්ථානය හිමිකරගත් පලස්තීනයට ලකුණු 96 ක්ද ලැබී තිබුණි.

ජර්මනියේ ශ්‍රී ලංකා තානාපති ගරු සරත් කොන්ගහගේ මහතා බර්ලින්හි ශ්‍රී ලංකා සංගමයට සුභපතා ප්‍රකාශ කර සිටියේ ශ්‍රී ලංකා සංගමය තම මව් රටට මෙම ත්‍යාගය ලබා ගැනිම සදහා ඇපකැප වි වටිනා මෙහෙවරක් සිදු කළ ඇති බවයි. එමෙන්ම සැරසිලි කළ කවුෂාල් හලද්දුව  හා රෝයි පතිරණටත්, සංගීත නිර්වරණය වෙනුවෙන් අරුන ලියන්ටන්, කුඩා ළමුන්ගේ නර්ථන අංග පුහුණු කිරිම් හා සංවිධානය කිරිම් සම්බන්ධයෙන් ඩි ජේ ප්‍රභාත් හා අනුෂා විරතුංග යන අයටත් තානාපති තුමන් ස්තුති කළේය. තවත් බොහෝ ශ්‍රී ලංකිකයින් මෙම කටයුත්ත්ත සදහා තම දායකත්වය ඉහලින්ම ලබා දි තිබුණි. තවද තානාපති තුමන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශයටත්, ශ්‍රී ලංකා තේ මණ්ඩලයටත් මෙම කර්ථව්‍ය සාර්ථක කර ගැනිම සදහා එම ආයතන දෙකෙන්ම ලැබු දායකත්වයට ස්තුති කර සිටියේය.

එමෙන්ම තානාපති තුමන් මෙම දායකත්වය ලබාදුන් ආයතන වලින් ඉල්ලා සිටිනුයේ බර්ලින් නුවර වාර්ෂිකව පවත්වනු ලබන මෙම සංස්කෘතික සංදර්ශණය මතකයෙහි තබා ගන්නා ලෙසත්, ශ්‍රී ලංකාවේ ප්‍රතිරූපය ජර්මනිය තුල ප්‍රවර්ධනය කිරිම සදහා වාර්ෂිකව බර්ලින්හි ශ්‍රී ලංකිකයන්ගේ සංගමයට තව අනුග්‍රහය ලබාදෙන ලෙසයි.